# සාමාන්‍ය සමයේ විසිතුන්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

කොලොස්සි 2: 6–15

**"අපේ සියලු පව් කමා කර ක්‍රිස්තුස් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබුවෙමු."**

ඔබ ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ වශයෙන් පිළිගෙන තිබෙන බැවින් උන් වහන්සේ හා ඒකාබද්ධ වී ජීවත් වන්න. උන් වහන්සේ තුළ මුල් ඇදගන්න පරිදි ස්ථිරව සිටින්න. උන් වහන්සේ සමඟ ඔබේ ජීවිත නිර්මාණය කර ගන්න. ඔබට උගන්වන ලද ඇදහිල්ලේ පිහිටා සිටින්න. බෙහෙවින් තුති පුදන්න.

ක්‍රිස්තුස් වහන්සේගෙන් නොවන, මිනිස් සම්ප්‍රදායයන් හා ලෝක භූතාධිපතීන් පදනම් කොටගත් දර්ශනවාදවලින් හා සම්ප්‍රලාපවලින් උගුල් අටවන අයගෙන් පරිස්සම් වන්න. මන්ද, ක්‍රිස්තුස් වහන්සේ තුළ, උන් වහන්සේගේ මිනිස් බවෙහි ම දේවත්වයේ පරිපූර්ණතාව වැඩ වාසය කරයි. සකල භූතාධිපතීන්ට හා බලධාරීන්ට ඉහළින් පරමෝත්තම වන උන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන් ඔබේ පූර්ණත්වය සැලසී ඇත. උන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන් ඔබ චර්මඡේදනය කරනු ලැබුවහු ය. ඒ වනාහි සැත්කමකින් කරන ලද චර්මඡේදනයක් නොව, මාංශික ක්ලේශයන් ඉවත් කිරීමේ චර්මඡේදනයකි. ක්‍රිස්තුස් වහන්සේගේ චර්මඡේදන පිළිවෙත

එයයි. මන්ද, බෞතීස්ම ස්නාපනයේ දී ඔබ උන්වහන්සේ සමග වළලනු ලැබ, උන් වහන්සේ මරණයෙන් උත්ථාන කළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරී බලය තුළ ඇති විශ්වාසය කරණකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබුවහු ය. ඔබ පව්කාරයන් නිසාත්, අචර්මඡේදිතයන් වූ නිසාත් මැරී සිටි නමුත්, දෙවියන් වහන්සේ ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග ජීවත් කර ඔබේ සියලු පව් කමා කළ සේක. අණපණත්වලට අප බැඳ තැබූ අපට අහිතකර ඇපකරය උන් වහන්සේ අවලංගු කළ සේක. එය කුරුසයේ ඇණ ගසා අපෙන් ඉවත් කළ සේක. මෙලෙස උන් වහන්සේ භූතාධිපතීන් ද බලධාරීන් ද නිරායුධ කොට ඔවුන් ප්‍රසිද්ධියේ ජය පෙරහරින් ගෙන ගොස් ප්‍රදර්ශනය කළ සේක.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145: 1-2, 8-11

පිළිතුර: සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පෙන්වන සේක.

ගීය:

මා දෙවි රජිඳුනි, ඔබ ගුණ මම ගයමි. ඔබ නම සදාකල් ම පසසමි.
සැම දා ඔබට තුති පුදමි. සදාකල් ඔබ නම පසසමි.
සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය. වහා නොකිපෙන සුලු ය. තිරසර පෙමින් යුතු ය.

සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක. එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ලන් වෙත පැතිරෙයි.
සමිඳුනි. ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි.

ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.
ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති. ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ඔබ ජීවන පණිවුඩය ප්‍රදානය කරන බැවින් අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන් බබළන්නහු ය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මා තෝරාගත්තේ නැත.
මම ඔබ තෝරාගෙන පත් කළෙමි"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 6: 12-19

**"ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් මුළු රැය ගෙවා ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු තෝරාගත් සේක."**

තවද, ඒ දවස්වල දී ජේසුස් වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැඟී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක. පහන් වූ කල උන්වහන්සේ සිය ගෝලයන් කැඳවා, ඔවුන් අතරෙන් ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු තෝරාගෙන ඔවුන්ට "අපෝස්තුළුවරු" යයි නම් තැබූ සේක. ඔව්හු කවුරු ද යත් උන්වහන්සේ විසින් පේදුරු යයි නම් කරන ලද සීමොන් සහ ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද ජාකොබ් සහ ජුවාම් ද පිලිප් සහ බර්තොලමෙව් ද මතෙව් සහ තෝමස් ද අල්පෙවුස්ගේ පුත් ජාකොබ් සහ අන්ත ජාතිවාදියා යි නම් ලත් සීමොන් ද ජාකොබ්ගේ පුත් ජුදස් සහ පසුව ද්‍රෝහියා වූ ජුදස් ඉස්කාරියොත් යන මොවුහු ය.

උන්වහන්සේ ඔවුන් සමග කන්දෙන් බැස තැනිතලා බිමක නැවතී සිටි සේක. උන්වහන්සේගේ ගෝලයන්ගෙන් මහා සමූහයක් ද, මුළු ජුදයෙන් හා ජෙරුසලමෙනුත්, තිර්හි සහ සීදොනයෙහි මුහුදුකරයෙනුත් උන්වහන්සේගේ දේශනා අසන්නට හා සිය රෝග සුව කරවා ගන්නට ආ බොහෝ දෙනෙක් ද එහි වූහ. අශුද්ධාත්මයන්ගෙන් පීඩිත වූවෝ සුව කරනු ලැබූහ. උන්වහන්සේ කෙරෙන් අනුහස නික්ම ඔවුන් සියල්ලන් සුව කළ බැවින්, මුළු සමූහයා උන්වහන්සේගේ ඇඟට අත තබන්නට උත්සාහ කළහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.